**කටුනායක නගර සභාව - 2023**

**----------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

කටුනායක නගර සභාවේ 2023 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් හා වියදම් ගිණුම, ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරුද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන නගර සභා ආඥා පනතේ (255 අධිකාරය) 181(1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට කටුනායක නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළ කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාශර්වයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

නගර සභාවේ මූල්‍ය වර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව නගර සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාචෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාචෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ නගර සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගැයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලැසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ නගර සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, නගර සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීති,රීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳව වාතර්‍ාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ)(iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව නගර සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ)(iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 ගිණුම්කරණ ප්‍රතිපත්ති

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ශේෂ පත්‍ර දිනට අවසන් වී නොමැති නඩු 30 ක් සම්බන්ධයෙන් මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි. | ඉදිරි වර්ෂයේ ඉදිරිපත් කරන බව. | ගිණුම්වල හෙළිදරව් කළ යුතුය. |

### 1.6.2 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | රු.108,869 ක ස්ථාවර තැන්පතු ගිණුම් ගතකර නොතිබුණි. | ඉදිරි වර්ෂයේදී නිවැරදි කරන බව. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයට අදාළ ඝන අපද්‍රව්‍ය අලෙවියෙන් ලැබී තිබුණු රු.111,103 ක ආදායම් ගිණුම්ගත කර නොතිබුණි. | ආදායමට ගෙන නිවැරදි කරන බව. | -එම- |
| (ඇ) | සමාලෝචිත වර්ෂය තුළ අවස්ථා 02කදී ඉදිකිරීම් සඳහා ගෙවන ලද එකතුව රු. 205,946 ක් ණයහිමියන් යටතේ දෝෂ සහගතව දක්වා තිබුණි. | ඉදිරි වර්ෂයේදී ගිණුම්ගත කරන බව. | -එම- |
| (ඈ) | සංචාරක පුරවරයක් බවට පත් කිරීමේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක නොවී තිබියදී රු.2,160,000 ක් දුම්රිය දෙපාර්තමේන්තුවට ගෙවිය යුතු සේ දෝෂ සහගතව ණයහිමියන් යටතේ දක්වා තිබුණි. | කපාහැරීමට කටයුතු කරන බව | නිවැරදි ගිණුම්ගත කළ යුතුය. |

### 1.6.3 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොමැතිවීම

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන එකතුව රු.1,373,616 ක ගිණුම් ශේෂ 03ක භෞතික පැවැත්ම ලේඛන, උපලේඛන හා ලිපිගොනු ඉදිරිපත් නොකිරීම නිසා ඒවා විගණනයේදී සතුටුදායක ලෙස සත්‍යාක්ෂණය කිරීමට නොහැකි විය. | පරික්ෂා කර බලා නිවැරදි කරන බව | ලේඛන භෞතිකව පරීක්ෂා කර ලේඛනගත ලිපිගොනු යාවත්කාලීන කළ යුතුය. |

### 1.7 අනුකූල නොවීම්

**නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්**

නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | අංක 2235/64 හා 2021 ජූලි 08 දිනැති අති විශේෂ ගැසට් පත්‍රයේ සංශෝධිත 1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරි පනත | | | |
| (i) | 28(1) ඡේදය | සභාව විසින් නිකුත් කරන ලද සංවර්ධන බලපත්‍රයක් ලබාගැනීමකින් තොරව ඉදිකිරීම් 49ක් පැවතුණි. | නීත්‍යානුකූල කරවීමට කටයුතු කරන බව. | පනතේ විධිවිධාන අනුව කටයුතු කළ යුතුය. |
| (ii) | 84 ඡේදය | අනුමත කරන ලද සංවර්ධන බලපත්‍රය හා සංවර්ධන සැලැස්මට අනුව නිම කර පදිංචි වීම සඳහා අනුකූලතා සහතිකයක් ලබාදිය යුතු වුවත්, 2019 සිට සමාලෝචිත වර්ෂය දක්වා කාලය තුළ අනුමත කළ ගොඩනැගිලි අයදුම්පත්‍ර 228 ක් සම්බන්ධයෙන් ඒ අනුව කටයුතු කර නොතිබුණි. | සුදුසු වැඩපිළියෙලක් සකස් කරන බව. | පනතේ විධිවිධාන අනුව කටයුතු කළ යුතුය. |

**(ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි**

| | | | |
|---|---|---|---|
| මුදල් රෙගුලාසි 571 (3) | 2013 සිට 2020 කාලයට අදාළ මිශ්‍ර තැන්පතු අවස්ථා 33 ක් හා 2014, 2022 කාලයට අදාළ රු.824,350 ක අතරුදවුම් අවස්ථා 21 ක් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | පරික්ෂා කර බලා නිරවුල් කරන බව. | මුදල් රෙගුලාසි අනුව කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.6,308,331 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.6,898,130 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

ලේකම් විසින් ඉදිරිපත් කළ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | | 2023 | | | | 2022 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | **ආදායම් ප්‍රභවය** | **ඇස්තමේන්තුගත ආදායම** | **බිල් කළ ආදායම** | **රැස්කළ ආදායම** | **දෙසැම්බර් 31 දිනට මුළු හිඟය** | **ඇස්තමේන්තුගත ආදායම** | **බිල් කළ ආදායම** | **රැස්කළ ආදායම** | **දෙසැම්බර් 31 දිනට මුළු හිඟය** |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) | වරිපනම් හා බදු | 8,000,000 | 7,683,959 | 7,138,241 | 7,318,830 | 8,000,000 | 7,646,784 | 7,753,822 | 6,773,112 |
| (ii) | කුලී | 5,670,000 | 5,577,101 | 5,348,347 | 1,693,266 | 3,475,000 | 3,347,446 | 3,505,947 | 1,464,511 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 700,000 | 638,753 | 638,753 | - | 750,000 | 695,469 | 691,969 | 29,500 |
| (iv) | වෙනත් ආදායම් | 13,140,000 | 10,462,941 | 10,389,305 | 7,859,400 | 13,600,000 | 9,596,770 | 2,192,605 | 7,785,764 |
| | | 27,510,000 | 24,362,754 | 23,514,646 | 16,871,496 | 25,825,000 | 21,286,469 | 14,144,343 | 16,052,887 |

### 2.2.2. ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

**සභාවේ ආදායම් රැස්කිරීමේ කාර්යසාධන සම්බන්ධ නිරීක්ෂණ දැක්වේ.**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| **(අ)** | **වරිපනම් හා බදු** | | |
| | සමාලෝචිත වර්ෂය අවසානයට හිඟ වරිපනම් බදු ශේෂය රු.7,318,830 ක් වූ අතර, ඒකකයක වරිපනම් බදු හිඟය රු.5,000 ඉක්මවූ වරිපනම් ඒකක 306 කින් එකතුව රු.3,161,838 ක් අයකර නොතිබුණි. | දේපල තහනම් කිරීම් කටයුතු මේ වන විටත් සිදුකරන බව. | පනතේ විධිවිධාන අනුව කටයුතු කර ආදායම් රැස්කළ යුතුය. |
| (ආ) | **කඩ කුලී** | | |
| | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පැවති රු.1,619,933 ක හිඟ කඩ කුලී ශේෂය තුළ එක් කඩ කාමරයක හිඟ කුලිය රු.754,650 ක්ද, රු.10,000 ත් 100,000 ත් කඩ කාමර 15කින් හිඟ ශේෂය රු. 453,758 ක් අයකර නොතිබුණි. | අයකරගැනීමට අදාළ පාර්ශව දැනුවත් කර ඇති බව. | හිඟ කුලී අයකළ යුතුය. |
| (ඇ) | **වෙනත් ආදායම්** | | |
| | නගර සභාව විසින් ත්‍රීරෝද රථ ගාස්තු සම්බන්ධව අතුරු ව්‍යවස්ථා පනවා ගෙන නොමැති අතර ත්‍රීරෝද රථ නැවතුම් ස්ථානද හඳුනා ගැනීමට ද කටයුතු කර නොතිබුණි. නගර සභා බල ප්‍රදේශය තුළ ත්‍රීරෝද රථ නැවතුම්පලවල් 20 කට වඩා පැවතියද ගාස්තු අය කිරීමට කටයුතු නොකිරීමෙන් සභාවේ ආදායම් මාර්ග ඇහිරී තිබුණි. | වැඩපිළිවෙලක් සකස් කර අයකරන බව. | අතුරු ව්‍යවස්ථා පනවා ගාස්තු අයකිරීමට කටයුතු කළ යුතුය. |
| **(ඈ)** | **උසාවි දඩ හා මුද්දර ගාස්තු** | | |
| | පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් සහ අනෙකුත් බලධාරීන්ගෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබුණු උසාවි දඩ රු.22,249 ක් හා මුද්දර ගාස්තු රු.7,187,000 ක් විය. | පරීක්ෂා කර බලා අය කිරීමට කටයුතු කරන බව. | උසාවි දඩ හා මුද්දර ගාස්තු ගෙන්වා ගත යුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 පනතින් පවරා ඇති කාර්යයන් ඉටු කිරීම

නගර සභා ආඥා පනතේ 4 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තව්‍යන් ඉටු කිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සභාව සතුව පවතින දර භාවිතයෙන් ක්‍රියාත්මක ආදාහනාගාරය 2020 නොවැම්බර් 25 දින සිට අක්‍රිය වී තිබුණද සමාලෝචිත වර්ෂය අවසාන දින වන විටත් එය අලුත්වැඩියා කර ගැනීමට කටයුතු කර නොතිබුණි. ඒ හේතුවෙන් මහජනතාව දැඩි දුෂ්කරතාවයන්ට මුහුණ දී තිබූ අතර සභාවේ ආදායම් උත්පාදන මාර්ගයද අවහිර වී තිබුණි. | ව්‍යාපෘතියක් ඉදිකිරීමට කටයුතු කරන බව. | ආදාහනාගාර අලුත්වැඩියා කර මහජන සේවාව සඳහා යොදවා ගත යුතුය. |
| (ආ) | නගර සභා ආඥා පනතේ (255 අධිකාරය) 118 වගන්තියේ විධිවිධාන වලට අනුව ප්‍රදේශයේ නිවාසවල මල අපද්‍රව්‍ය බැහැර කිරීම සඳහා විධිමත් ලෙස වලවල් නිසි කාල සීමාව තුළ පවිත්‍ර කිරීම හා හිස් කිරීමට හැකිවන පරිදි ගලි රථ සේවාවක් පවත්වාගෙන ගොස් නොතිබුණි. | ඉදිරියේදී අවශ්‍ය පහසුකම් සපයා ගැනීමට කටයුතු කරන බව. | පනතේ කාර්යයන් ඉටුකළ යුතුය. |

### 3.2 හඳුනාගත් පාඩු

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| භාණ්ඩ සමීක්ෂණ වාර්තා අනුව පුස්තකාල පොත් 553 ක ඌනතාවයක් විය. | නිවැරදි ශේෂ හඳුනාගැනීමට කටයුතු කරන බව. | ඌනතාවයට අදාළ පාර්ශව හඳුනාගෙන අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

### 3.3 අවිධිමත් ගනුදෙනු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | නගර සභා ආඥා පනතෙහි 158 (ඉ) ප්‍රකාරව විකිණීම්වලින්, බදු දීම්වලින් හෝ සභාවේ වෙනත් ගනුදෙනුවලින් ලැබෙන සියලු මුදල් සභා අරමුදලට ගෙවිය යුතු බව දක්වා තිබුණද, 2016 වර්ෂයේ සිට ඉකුත් වර්ෂය දක්වා කාලය තුළ ඝන අපද්‍රව්‍ය අලෙවියෙන් ලද රු.1,163,267 ක ආදායමක් ආදායමට බැර නොකර සෞඛ්‍ය සේවකයින් සඳහා ගෙවා තිබුණි. | සභා අනුමැතියක් ඇති බව. | පනතේ විධිවිධාන අනුව කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | සංචාරක පුරවරයක් බවට පත් කිරීමේ ව්‍යාපෘතිය සඳහා 2021 මාර්තු 03 දින දුම්රිය දෙපාර්තමේන්තුව වෙත රු.1,360,400 ක මුදලක් ගෙවා ඇති අතර අදාළ දේපල බදු ගැනීම සම්බන්ධව දෙපාර්ශවය විසින් ගිවිසුම්ගත වීමට කටයුතු කර නොමැති බැවින් ගොඩනැගිල්ල සභාවට නොලැබීම හේතුවෙන් ඒ සඳහා ගෙවූ රු.1,360,400 ක මුදල ආපසු ලබාගැනීමට කටයුතු කර නොතිබුණි. | මේ සම්බන්ධව ඉදිරියේදී කටයුතු කරන බව. | ආපසු ලබාගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | සභාවට අයත් භූමියක් නිවාස 08 ක් ඉදිකිරීමට පර්චස් 48 ක් බාහිර පාර්ශවයකට ලබා දී තිබුණි. | නගර සභාව සතු දේපලක් බව. | විධිමත් අනුමැතියකින් වත්කම් බැහැර කළ යුතුය. |

**3.4 කළමනාකරණ අකාර්යක්ෂමතා**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට කර්මාන්ත ණය හිමි ශේෂය රු. 4,660,537 ක් වූ ඉන් වසර 01 ත් 05 ත් අතර රු.612,080 ක් ද වසර 05ට වැඩි රු.1,470,490 ක් විය. | ඉදිරියේදී නිරවුල් කිරීමට කටයුතු කරන බව. | හේතු සොයා බලා නිරවුල් කළ යුතුය. |
| (ආ) | 2018-2020 කාලයට අදාළ රු. 832,301 ක ඉඩම් බදු ණය හිමියන් යටතේ දක්වා තිබුණද ඒවා නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | ඉදිරියේදී නිරවුල් කිරීමට කටයුතු කරන බව. | හේතු සොයා බලා නිරවුල් කළ යුතුය. |
| (ඇ) | විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවට ගෙවිය යුතු දායක විශ්‍රාම වැටුප් ශේෂය රු. 538,187 ක් ප්‍රේෂණය කිරීමට කටයුතු කර නොතිබුණි. | නිරවුල් කිරීමට කටයුතු කරන බව. | චක්‍රලේඛ උපදෙස් අනුව කටයුතු කළ යුතුය. |

**3.5. මතභේදයට තුඩුදෙන ගනුදෙනු**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අවශ්‍යතාවය හඳුනාගැනීමකින් තොරව රු.180,766 ක සබන් කැට 1273 ක් මිලදී ගෙන ගබඩාවේ ගබඩාකර තිබුණි. | මිල උච්ඡාවචනය සිදුවූ බව. | අවශ්‍යතාවය හඳුනාගෙන මිලදී ගත යුතුය. |

### 3.6 නිෂ්කායර් හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| එකතුව රු.206,654,644 ක වාහන 03ක් , යන්ත්‍රයක් හා ඉඩම් 02 ක් වසර 01 ත් වසර 15 ත් අතර කාල පරාසයක සිට නිශ්ක්‍රියව හා ඌන උපයෝජිතව පැවතුණි. | වෙනත් ආයතනවලට ලබාදීමට හෝ , විකිණීමට කටයුතු කරන බව. | අලුත්වැඩියා කර වත්කම් උපයෝජනය කළ යුතු අතර එසේ කළ නොහැකි වත්කම් අපහරණය කළ යුතුය. |

### 3.7 වත්කම් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සභාව පරිහරණය කරන ඉඩම් හා ගොඩනැගිලි 04 ක්, තානායම හා වෙළඳ සංකීර්ණය පිහිටි ඉඩම්වල අයිතිය පවරාගෙන නොතිබුණි. | පවරාගැනීමේ කටයුතු සිදුකරමින් පවතින බව. | නිත්‍යානුකූලව අයිතිය පවරා ගත යුතුය. |
| (ආ) | රු.1,200,000 ක කැබ් රථයක්, රු.7,967,144 ක සිංගල් ඩ්‍රම් වයිබ්‍රේටින් රෝලර් යන්ත්‍රයක් හා වටිනාකම හඳුනානොගත් සිංගල් කැබ්රථයක් පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. | කටයුතු සිදුකෙරෙමින් පවතින බවත | පවරා ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | නගර සභාවට අයත් අක්කර 01 රූඩ් 01 පර්චස් 32.9 ක් වූ කලාදූරුකොටුව ඉඩමට ආරක්ෂිත වැටක් යොදා නොතිබුණු අතර අනවසර පදිංචිකරුවන් විසින් ඉඩම අත්පත්කර ගෙන තිබුණද ඔවුන් ඉවත් කිරීමට හෝ ඉඩම මැනුම් කර වැට මායිම් ඉදිකිරීමට කටයුතු කර නොතිබුණි. | අනවසර පදිංචි කරුවන් සිටීනම් ඉවත් කිරීමට කටයුතු කරන බව. | වත්කම්වල ආරක්ෂාව තහවුරු කළ යුතුය. |
| (ඈ) | තානායමේ කළමනාකාරිත්වය භාරව සිටි ආයතනය 2018 අගෝස්තු 31 දිනෙන් පසු ඉවත් වී තිබීම හේතුවෙන් තානායමේ කටයුතු සභාවට පැවරී තිබුණද සභාව ඉන් ආදායම් උපයාගැනීමට හැකිවන පරිදි පවත්වා ගැනීමට කටයුතු නොකර වසා දමා තිබුණු අතර එම තානායම සඳහා 2019 අප්‍රේල් සිට 2020 දෙසැම්බර් දක්වා සභා සේවකයින් දෙදෙනෙකු සේවයේ යොදවා රු.1,544,061 ක නිශ්කාර්ය වියදමක් දරා තිබුණි. | 2009 සිට කළමනාකරිත්වය නගර සභාව සතුව පවතින බව. | ආදායම් උපයා ගැනීමට කටයුතු කළ යුතුය. |

### 3.8 මානව සම්පත් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය<br>සේවක පුරප්පාඩු හා අතිරික්ත | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | අනුමත කාර්ය මණ්ඩලය හා තත්‍ය කාර්යමණ්ඩලය සැසඳීමේදී ඉන් තනතුරු 16 ක පුරප්පාඩු 28 ක් ද එක් තනතුරක අතිරික්තතා 17 ක් ද පැවතුණි. | චක්‍රලේඛ විධිවිධාන පරිදි පුරප්පාඩු පිළිබඳ කටයුතු කළ නොහැකි බව හා අතිරික්ත කාර්යය මණ්ඩලය සංවර්ධනය නිලධාරීන් බව. | පුරප්පාඩු සම්පූර්ණ කරගත යුතුය. |
| (ආ) | 2018 – 2020 කාලයක තුළ සේවය අතහැර ගිය, විශ්‍රාම ගිය හා ස්ථාන මාරු වී ගිය නිලධාරීන් හා සේවකයින් 6 දෙනෙකුගෙන් එකතුව රු.262,843 ක ණය ශේෂයක් අයකර ගැනීමට හා ඉකුත් වර්ෂයේ ස්ථාන මාරු වී පැමිණි නිලධාරියෙකුගේ රු.36,000 ක ණය ශේෂයක් පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. | අයකර ගැනිමට කටයුතු කරන බව. | ණය ශේෂ අයකර ගත යුතුය. |

## 4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

### තිරසර සංවධර්න අරමුණු

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සභාව විසින් තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක හා ඊට අදාළ දර්ශකද හඳුනාගෙන තිබුණද එම ඉලක්ක ළඟා කරගැනීමට කටයුතු කර නොතිබුණි | ඉදිරියේදී අදාළ කටයුතු ඉටුකරන බව. | තිරසර සංවර්ධන දර්ශක හඳුනාගෙන අරමුණු හා ඉලක්ක ඉටුකර ගත යුතුය. |